# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල



තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1651/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 30/10/2024 පැය 0930

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ**

**01. 2024.10.29 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 06 | 06 | 214 | 360 | තඹ දඟර 04<br>යකඩ බැරල් 06 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශය.**

2024.10.29 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අතුරුගිරිය පොලිස් වසමේ හබරකඩ ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 40 මිලි ග්‍රෑම් 10 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන අතුරුගිරිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 19 ක් වන රනාල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. හෙරොයින් හා අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර**

2024.10.29 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කුරුණෑගල පොලිස් වසමේ බෝයගනේ ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 04 මිලි ග්‍රෑම් 900 ක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 යි මිලි ග්‍රෑම් 110 ක් එම ජාවාරමෙන් උපයා ගන්නා බවට සැකකරන මුදල් රුපියල් 33,000/- ක් හා ඉලෙක්ට්‍රික් තරාදියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කුරුණෑගල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු** 36 ක් වන කුරුණෑගල **ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කුරුණෑගල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුර .**

2024.10.29 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වාලච්චේන පොලිස් වසමේ ඔඩ්ඩමාවඩි ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 190 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඔඩ්ඩමාවඩි පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු** 39 ක් වූ ඔඩ්ඩමාවඩි **ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වාලච්චේන පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වව්නතිව් කඳවුර .**

2024.10.29 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වව්නතිව් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කරදියනාරු පොලිස් වසමේ කිතුල ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කරදියනාරු පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු** 41 ක් වූ කරදියනාරු **ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කරදියනාරු පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06. බලපත්‍ර නොමැතිව ටිපර් රථයකින් වැලි ප්‍රවාහනය කළ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුර .**

2024.10.29 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කින්නියා පොලිස් වසමේ ඊච්චන්තිව් ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කළ සැකකරුවෙකු ටිපර් රථය සමඟ** අත්අඩංගුවට ගෙන කින්නියා පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු** 31 **ක් වූ කින්නියා ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කින්නියා පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**